# ධාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

42 වන කාණ්ඩය | 04 වන කලාපය | 2026 මැයි කලාපය


# සියළුම වැඩකරන ජනතාවගේ ශ්‍රමයට ගෞරවයට කැපවිමට යුක්තිය ඉටුවන මැයි දිනයක්




මැයි දිනය යනු ඉතිහාසය පමණක් නොව කම්කරුවන්ගේ අනාගතය ගොඩනගන පොරොන්දුවකි. වසර 140ක කම්කරුවන්ගේ අභිමානය වෙනුවෙන් කැපවෙන අඛණ්ඩ අරගලය, ජාත්‍යන්තර කම්කරු දිනය ධාබිඳු අපි, වෘත්තීය සමිති හා සිවිල් සංවිධාන කිහිපයකම සහාභාගීත්වයෙන් දාවින්ද්‍රි මෙන්ඩිස් ක්‍රීඩාංගණය අසලින් ආරම්භ වූ පාගමනින් පැමිණ 18 කණුව රේල් ගේට්ටුව අසල දී ප්‍රචාරක රැළිය කටුනායක දී පවත්වනු ලැබීය. එහි දී ධාබිඳු සාමූහික සංගමය, ශ්‍රමාභිමානී කේන්ද්‍රය, ශ්‍රී ලංකා සමානාත්මතා පදනම ආයතනය, නිමි භාණ්ඩ හා රෙදි පිළි සේවක සංගමය, අපි කාන්තාවෝ සංවිධානය, ශ්‍රී විමුක්ති ධීවර කාන්තා සංවිධානය, ප්‍රජා දිරිය පදනම, ගම්පහ දිස්ත්‍රික් පුරවැසි කමිටුව, මානව විමුක්තිය උදෙසා සංවර්ධනය ආයතනය වැනි සංවිධානයන්හි විශාල පිරිසක් අත්වැල් බැඳ ගන්නා ලදී. මේ සඳහා වැඩකරන ජනතාව නියෝජනය කරමින් වැඩකරන පන්තිය නියෝජනය කරමින් විශාල පිරිසක් නන් දෙසින් පැමිණ සිටියහ. මෙය කම්කරුවන්ගේ අයිතිවාසිකම්, ගෞරවය, සමානාත්මතාව සහ සුරක්ෂිත

2 වන පිටුවට...

## ඇතුළු පිටු


03-04 පිටු - සමාජ සාධාරණත්වය සහ ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීම උදෙසා සියළු දෙනාට ගෞරවනීය රැකියාවක්

05-06 පිටු - අපේ වැඩ

07-08 පිට - කම්කරු අයිතිවාසිකම්

9 පිටුව - බ්‍රිටෝ ප්‍රනාන්දු සහෝදරයා සාදරයෙන් පිළිගනිමු

10 පිටුව - සිතුවිල්ල/ප්‍රහේළිකාව

11 පිටුව - කවි පිටුව/විදෙස් පුවත්

# ඩාබිඳු සාමූහිකය

221, වෙළඹඩ පාර, කටුනායක
දුර : 011 4 851 383
ඊ. මේල් : dabindu.infoco@gmail.com
Facebook : dabindu collective sri lanka
Web : www.dabinducollective


# ජාත්‍යන්තර කම්කරු දිනයේ වෘත්තීය සමිති වගවීම

සෞඛ්‍ය සම්පන්න මනෝ සමාජීය වැඩ පරිසරයක් සහතික කිරීම ගෝලීය තේමාව කොට ගත් ජාත්‍යන්තර කම්කරු දින සැමරුම උත්සවශ්‍රීයෙන් ගෝලීය වශයෙන් ක්‍රියාත්මක විය. මෙතුළින් සේවක බලය, සහයෝගීතාවය, ගෞරවය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය තේමා කොටගනිමින් ගෝලීය එකමුතුව තුළින් සූරාකෑමට එරෙහිව කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳව ද කම්කරුවෝ වගවීම ඉල්ලා සිටියහ.

අධික ලාභය මත ක්‍රියාත්මක වන ඇඟළුම් කර්මාන්තයේ ගාමක බලය වන්නේ කාන්තාවන්ය. ආසියාව පුරා ගෝලීය උතුරට ඇඟළුම් යවන කම්කරුවන් දරිද්‍රතා මට්ටමේ වැටුප්, ප්‍රචණ්ඩත්වය, හිංසනය හා කේවල් කිරීමට, සංගමයේ නිදහස වැනි මූලික සිද්ධාන්තවලට අභියෝග කරයි.

වර්තමානයේ පවතින ගෝලීය අර්බුද තුළ යුධ ගැටුම් මිලිටරිකරණයේ ප්‍රතිඵල ලෙස විදුලි බිල ඉහළ යාම හේතුවෙන් කම්කරුවන්ගේ දෛනික ජීවිතය බරපතල ලෙස කඩා වැටී ඇත. මූලික අවශ්‍යතාවන් වල පිරිවැය ඉහළ ගොස් ඇත. ගෝලීය බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස කම්කරුවන්ගේ ජීවිත තවදුරටත් අනාරක්ෂිතකොට ඇත.

ඉතාමත් අවදානම් තත්ත්වයන් තුළ හාම්පුතා තමන්ගේ ලාභය තහවුරු කර ගැනීමට දරණ උත්සහයන්වල දී කර්මාන්තශාලා වසා දැමීම, සේවා බණ්ඩනයට, රැකියා කප්පාදු කිරීම, අතිකාල අහිමි කිරීමට කටයුතු කරමින් සිටින අතර දින 4ක සේවා කාලයක් ලබා දෙන ලෙසද ඉල්ලීම් කරයි. මෙවැනි තත්ත්වයන් තුළ වඩාත් අනාරක්ෂිත වන කම්කරු කාන්තාවන් ජීවනෝපාය සම්බන්ධව ගැටළු වලට මුහුණ දෙමින් අනාරක්ෂිතභාවයට පත් වේ. කායික, මානසික, ආර්ථික ආතතීන්ට ගොදුරු වෙමින් හිංසනය හා ප්‍රචණ්ඩත්වය තීව්‍ර ලෙස ඉහළ යාම කම්කරු අයිතිවාසිකම් කප්පාදු කරමින් පාලකයාට හිතවාදී නීති රීති සම්පාදනය කිරීමට කටයුතු කරමින් ගෞරවනීය රැකියා වෙනුවට වහල් ශ්‍රමය, ශ්‍රම සූරාකෑම තුළින් ඉදිරියට පවත්වා ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගැනීමට පෙරමුණ ගෙන සිටී. මෙවැනි කර්කෂ වටපිටාවක් තුළ සංවිධානය වීමට අවැසි ගෝලීය ශක්තිය, බලය දිනා ගැනීමට රටවල් විසින් සම්පාදනය කර ඇති ප්‍රතිපත්ති හා සම්මුතීන් භාවිතයට ගැනීමට ද, රජයන්ට බල කිරීමට ද අපගේ සාමූහික ශක්තිය පෙන්වමු.

1 පිටුවෙන්... **සියළුම වැඩකරන ජනතාවගේ**

සේවා පරිසරයක් වෙනුවෙන් සිදුකරන ලද මැයි දිනයක් වීම විශේෂත්වයකි. වෙළඳ කලාප වල ක්‍රියාශීලී තරුණ තරුණියන්, ගොවි, ධීවර ප්‍රජාව අප සමඟ අත්වැල් බැඳ ගන්නා ලදී. රටේ විවිධ ප්‍රදේශ වලින් පැමිණි ධන කුවේරයන් වෙනුවෙන් වැඩකරන අපේ සහෝදර සහෝදරියන්ගේ ගැටලු වන ඉහළ ජීවන වියදම්, කම්කරු අයිතිවාසිකම් උල්ලංඝනය වීම්, ලිංගික හිංසන වැනි බොහෝ කම්කරු ගැටලු මෙහි දී සිවිල් සංවිධාන නායක නායිකාවන් විසින් ඉදිරිපත් කරන ලදී. මෙහි දී ඩාබිඳු සාමූහික සංගමයේ ප්‍රධාන ලේකම් චමිලා තුෂාරී සහෝදරිය විසින් සභාවේ ප්‍රධාන කතාව සිදු කළ අතර මෙවර කම්කරු දිනට සමගාමීව පොදු ප්‍රතිපත්ති ප්‍රකාශය ශ්‍රමාභිමානී කේන්ද්‍රයේ වැඩසටහන් අධ්‍යක්ෂිකා නීතිඥ ඉසුරි රොද්‍රිගෝ සහෝදරිය විසින් ඉදිරිපත් කළ අතර මානව විමුක්තිය උදෙසා සංවර්ධනය ආයතනයේ (රෙඩ් යුනියන්) ප්‍රධාන ලේකම් චන්ද්‍රා දේවනාරායන සහෝදරිය, ආචාර්ය සේපාලී කෝට්ටේගොඩ මහත්මිය, නිම් භාණ්ඩ සහ රෙදිපිළි ඇඟළුම් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් ලලිතා රංජනී සහෝදරිය ප්‍රජා දිරිය පදනම නියෝජනය කරමින් එහි විධායක අධ්‍යක්ෂිකා ඉන්ද්‍රානී කුසුමලතා සහෝදරිය ද, ගම්පහ දිස්ත්‍රික් පුරවැසි කමිටුව නියෝජනය කරමින් එම්. කුසුම් සිල්වා සහෝදරිය ද අපි කාන්තාවෝ සංවිධානය නියෝජනය කරමින් තරුණ සම්බන්ධීකාරක සෂේන්කා අබේසූරිය සහෝදරිය ශ්‍රමාභිමානී කේන්ද්‍රයේ වැඩසටහන් සම්බන්ධීකාරක සුගත් රාජපක්ෂ සහෝදරයා, ශ්‍රී විමුක්ති ධීවර කාන්තා සංවිධානය නියෝජනය කරමින් ක්‍රිස්ටිනා දුලානි සහෝදරිය සහ ශ්‍රී ලංකා සමානාත්මතා පදනම ආයතනය නියෝජනය කරමින් වැඩසටහන් කළමනාකාරිණී රිශිනි ඩිල්ශානි සහෝදරිය යන පිරිස සභාව තුළ සිය සංවිධානයන් නියෝජනය කරන ප්‍රජාව වෙනුවන් අදහස් ඉදිරිපත් කරන ලදී.





# සමාජ සාධාරණත්වය සහ ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීම උදෙසා සියළු දෙනාට ගෞරවනීය රැකියාවක්

## (ඩාබිඳු සාමූහික සංගමය - ජාත්‍යන්තර කම්කරු දින ප්‍රකාශය)

වසර හතළිස් එකක ඉතිහාසයක සිට, ඩාබිඳු සාමූහිකය ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තයේ හදවත වන කාන්තා සේවිකාවන් වෙනුවෙන් පෙනී සිටී. පසුගිය වසර පහ තුළ, අපි කාන්තාවන්ගේ ශ්‍රමය මත පවතින ඇඟළුම් ක්ෂේත්‍රයේ කාන්තාවන්ගේ නායකත්වය සහිත වෘත්තීය සමිතිකරණය තීව්‍ර කිරීමට උත්සහ දරන්නෙමු.

මේ වසරේ, අපි හඬ නගන්නේ ඇඟළුම් කර්මාන්තය ගැඹුරු අර්බුදයකට මුහුණ පාමින් සිටින මොහොතකය.

**කර්මාන්තශාලා වැසීම වැඩි වෙමින් පවතී.**
**නිෂ්පාදන ඉලක්ක තීව්‍ර වෙමින් පවතී.**
**රැකියාව වඩාත් අනාරක්ෂිත වෙමින් පවතී.**
**කම්කරුවන් වඩාත් අවදානමට ඇද වැටෙමින් පවතී.**

අපි පැහැදිලිව කියන්නේ. මෙය සෑම කෙනෙකුගේම "ආර්ථික අර්බුදයක්" නොවේ. එය කම්කරුවන් මත පටවන ලද අර්බුදයකි. අද වනවිට මෙම සූරාකෑමේ ක්‍රමය ආර්ථික අස්ථාවරත්වයෙන් සහ ගෝලීය අර්බුදයකින් ඇතිවන දැඩි පීඩනයෙන් ද පිරී ඇති අතර, වර්තමානයේ උත්සන්න වන යුද්ධ, මිලිටරිවාදය සහ භූ දේශපාලනික වෙළඳ ගැටුම් මඟින් තවදුරටත් තීව්‍ර වේ.

ගෝලීය සුඛෝපභෝගී වෙළඳ නාම තම ලාභ ආරක්ෂා කර ගැනීමට ගෙන ඇති පියවර වන්නේ ඇණවුම් අවලංගු කිරීම හෝ අඩු කිරීම, ගෙවීම් සහ බෙදාහැරීම් ප්‍රමාද කිරීම සහ රටවල් අතර මූලාශ්‍ර මාරු කිරීමයි.

දශක ගණනාවක් තිස්සේ කාන්තා සේවිකාවන් අඩු වැටුප් සහිත ශ්‍රමය, වැටුප් නොලබන සුරැකුම් ශ්‍රමය සහ ඔවුන්ගේ අවධානයක් නොලබන සෞඛ්‍ය හමුවේ මෙම ක්ෂේත්‍රය තුළ වඩාත් අවදානමකට ලක්ව ඇත. වත්මනය වන විට ඔවුන් නිර්මාණය නොකළ, තවත් අර්බුදයක පීඩිතයන් බවට පත්වීමට ඔවුන්ට සිදුව ඇත.

අපි මෙය ප්‍රතික්ෂේප කරමු. ශ්‍රම සූරාකෑම සාමාන්‍යකරණය කිරීම පහත සඳහන් දෑ හරහා දිගින් දිගටම වෙමින් පවතී.

- නිසි ගෙවීමක් සිදු නොවන, නීතිමය සීමාවන් ඉක්මවා යන, වැඩ කරන පැය ගණන දීර්ඝ කිරීම.
- වගවීමෙන් තොර වීම සඳහා උපක්‍රමයක් ලෙස තාවකාලික සේවකයන් සහ අවිධිමත් සේවක පිරිස යොදා ගැනීම වැඩි කිරීම.
- මූලික ජීවන වියදම්වත් සපුරාලීමට අපොහොසත් වන වැටුප් පද්ධති.
- සේවකයින්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍යයට හානි කරන නිෂ්පාදන ඉලක්ක
- වෘත්තීය සමිති උපක්‍රමශීලීව මර්දනය කිරීම සහ සේවක නායිකාවන්ට එරෙහිව බලපෑම් ඇති කිරීම.

එපමණක් නොව ජාතික රැකවරණ පද්ධතියක් නොමැතිවීම, ප්‍රමාණවත් ළමා රැකවරණයක් සහ කාන්තා ද්විත්ව ශ්‍රමය සඳහා නිසි පිළිගැනීමක් නොමැතිවීම නිසා කාන්තා සේවිකාවන් වැටුප් නොලබන සුරැකුම් වැඩවල නොපෙනෙන බරක් උසුලයි.

4 වන පිටුවට...



3 පිටුවෙන්... **සමාජ සාධාරණත්වය...**

නීතිමය ආරක්ෂාවන් තිබුණද, සංවිධානය වීමේ නිදහස වඩ වඩාත් අඩපණ වෙමින් පවතී. විශේෂයෙන් නිදහස් වෙළඳ කලාපවල වෘත්තීය සමිති බිඳ දැමීම, බිය ගැන්වීම සහ නිරීක්ෂණ තීව්‍ර වෙමින් පවතී. සංවිධානය වීමට, කතා කිරීමට සහ සාමූහිකව කේවල් කිරීම යන මූලික අයිතිවාසිකම් කම්කරුවන්ට අහිමිව ඇත.

**මෙම තත්ත්වයන් පදනම් කරගනිමින් 2026 දී අපගේ ඉල්ලීම් ලෙසඃ**

- රැකියා සුරක්ෂිතභාවය සහතික කිරීම සහ වන්දි නොමැතිව අසාධාරණ ලෙස රැකියාව අවසන් කිරීම් සහ කර්මාන්තශාලා වසා දැමීම් වහාම නතර කිරීම.
- සැබෑ ජීවන වැටුපක් ස්ථාපිත කිරීම සහ සියළුම ඇඟළුම් සේවකයින් සඳහා සාධාරණ අවම වැටුපක් බලාත්මක කිරීම.
- පැය 8 ක වැඩ දිනය දැඩි ලෙස බලාත්මක කිරීම සහ සියළු ආකාරයේ බලහත්කාරයෙන් සහ නොගෙවූ අතිකාල අවසන් කිරීම.
- තාවකාලික සහ කොන්ත්‍රාත් මත පදනම් වූ වැඩවල සේවකයින් ආරක්ෂා කිරීම තුළින් අස්ථිර රැකියා අවසන් කිරීම.
- වැටුප් නොලබන සුරැකුම් වැඩ හඳුනාගෙන සේවා ස්ථාන තුළ ළමාරක්ෂක පහසුකම් ඇතුළුව ජාතික රැකවරණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
- ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා කම්කරු නීති ප්‍රතිසංස්කරණය කිරීම.
- ශ්‍රම සූරාකෑමේ නිෂ්පාදන ඉලක්ක ඉවත් කිරීම සහ කර්මාන්තශාලා පිළිවෙත් පිළිබඳ රාජ්‍ය මට්ටමේ අධීක්ෂණය හඳුන්වා දීම.
- සංවිධානය වීමේ නිදහස සහතික කිරීම, වෘත්තීය සමිති ආරක්ෂා කිරීම සහ සියලු ආකාරයේ වෘත්තීය සමිති කඩාකප්පල් කිරීම් අවසන් කිරීම.
- සේවා ස්ථාන තුළ සහ ඒ අවට ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර සඳහා ශුන්‍ය ඉවසීමක් බලාත්මක කිරීම.
- අසනීප නිවාඩු, මාතෘ සහ දෙමාපිය නිවාඩු ඇතුළු වැටුප් සහිත නිවාඩු සහතික කිරීම.
- සේවකයින් සඳහා පෝෂ්‍යදායී සහ දැරිය හැකි ආහාර සහ ප්‍රවේශ විය හැකි සෞඛ්‍ය සේවා සැපයීම.
- පැය 24 පුරාම ක්‍රියාත්මක වන කාන්තා හා ළමා ආරක්ෂණ පද්ධති ස්ථාපිත කිරීම.
- සියළුම සේවකයින් සඳහා පුළුල් සමාජ ආරක්ෂණ පද්ධති ස්ථාපිත කිරීම.
- තම පදිංචි දිස්ත්‍රික්කවලින් බැහැරව ජීවත් වන සේවකයින් සඳහා ඡන්ද අයිතිය සහතික කිරීම.
- සියළුම අංශ හරහා කාන්තා සේවිකාවන්ගේ ගෞරවය, සෞඛ්‍යය සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

තවද ජාත්‍යන්තර වෙළඳ සන්නාමවලින් අපි ඉල්ලා සිටින්නේ ඔවුන්ගේ සැපයුම් දාමයන් තුළ සිටින කම්කරුවන්ගේ තත්ත්වයන් සඳහා සම්පූර්ණ වගකීම භාර ගන්නා ලෙසයි. ලාභය යනු කම්කරුවන්ගේ ශ්‍රම සූරාකෑම, රැකියා අස්ථාවරත්වය සහ ඉවත් කිරීමේ හැකියාව මත ගොඩනගා ගත හැකි දෙයක් නොවෙයි.

කාන්තා සේවිකාවන් යනු කර්මාන්ත ශාලාවල කම්කරුවන් පමණක් නොවේ - ඔවුන් නිවසේ, ප්‍රජාවේ සහ ජාතික ආර්ථිකයේ කොඳු නාරටියයි. ඔවුන්ගේ ශ්‍රමය කර්මාන්ත පවත්වාගෙන යාමට ඉවහල් වූ නමුත්, ඔවුන්ගේ ජීවිත තවමත් අනාරක්ෂිතය.

මෙය අවසන් විය යුතුමය. මේ මැයි දිනයේදී, අපි ශ්‍රම සූරාකෑමට එරෙහිව පමණක් නොව, සාධාරණත්වය, ගෞරවය, සැලකිල්ල සහ කම්කරු බලය මත ගොඩනැගුණු වෙනස් අනාගතයක් සඳහා නැගී සිටිමු.

අපගේ ශ්‍රමය ලාභදායී නොවේ. අපගේ ජීවිත වියදම් කළ නොහැකි ය.

සියළු දෙනාට ගෞරවනීය රැකියාවක් - සමාජ සාධාරණත්වය ඉදිරියට ගෙන යාම!

**කම්කරු සහයෝගීතාවයට ජය!**

***සියළුම කාන්තා සේවිකාවන්ට ගෞරවය සහ යුක්තිය!***

# කණ්ඩායම් මනෝ සමාජීය සහය අපෙන්



2026 අප්‍රේල් 05 වන දින බියගම සහ වව්නියාව යන ප්‍රදේශවල නිදහස් වෙළඳ කලාප සහ කර්මාන්තශාලා තුළ සේවය කරන, දිට්වා ආපදා තත්ත්වය හමුවේ පීඩාවට පත් ප්‍රජාවන් සඳහා පශ්චාත්-ආපදා මානසික සෞඛ්‍ය සහ චිත්තවේගීය යහපැවැත්ම කෙරෙහි අවධානය යොමු කරමින් කණ්ඩායම් උපදේශන වැඩසටහනක් සාර්තකව පවත්වන ලදී. මෙම වැඩසටහනේ අරමුණ වූයේ ආපදා තත්ත්වයෙන් පසු අත්විඳින ආතතිය, කම්පනය සහ චිත්තවේගීය දුෂ්කරතා කළමනාකරණය කිරීමේදී සහභාගීවන්නන්ට සහාය වීමයි. බියගම සැසිය සඳහා මනෝ උපදේශිකා ගංගා රත්නායක මහත්මිය විසින් සම්පත්දායකත්වය ලබා දුන් අතර වව්නියාව සැසිය සඳහා මනෝ උපදේශිකා තුෂාන්තන් ප්‍රියදර්ශනී මහත්මිය විසින් මෙහෙයවන ලදී.

ඒ හරහා අන්තර්ක්‍රියාකාරී සාකච්ඡා, උපදේශන ක්‍රියාකාරකම් සහ අත්දැකීම් බෙදා ගැනීමේ සැසි හරහා, සහභාගිවන්නන්ට ඔවුන්ගේ චිත්තවේගීය අභියෝග විවෘතව සාකච්ඡා කිරීමට සහ ආරක්ෂිත පරිසරයක එකිනෙකාට සහයෝගය දැක්වීමට දිරිමත් කරන ලදී. මෙම සැසි මඟින් සහභාගිවන්නන්ට මානසික සෞඛ්‍ය රැකවරණය, ආතති කළමනාකරණය, චිත්තවේගීය සුවය සහ ආපදා තත්ත්වයන්ගෙන් පසු සාමූහික සහයෝගයේ වැදගත්කම අවබෝධ කර ගැනීමට උපකාර විය. සහභාගිවන්නන් තම අත්දැකීම් බෙදා ගැනීමට සහ ඒවාට මුහුණ දීමේ යාන්ත්‍රණයන් සහ චිත්තවේගීය සුවය පිළිබඳ මග පෙන්වීම ලබා ගැනීමට අවස්ථාව අගය කළහ.



# සැමට පෝෂ්‍යදායී ආහාර වේලක්

පසුගිය දිට්වා සමයේ පීඩාවට ලක් වූ බියගම නිදහස් වෙළඳ කලාපයේ සේවය කරනු ලබන සේවක සේවිකාවන් සඳහා පොදු කුස්සිය තේමාව යටතේ වැඩසටහනක් 2026/04/05 වන දින බියගම ඩාබිඳු කාර්යාලය සහ බියගම නේවාසිකාගාර ආශ්‍රිතව සිදු කරන්නට විය. ඒ අනුව සේවක සේවිකාවන් 100කට අධික පිරිසක් වෙනුවෙන් ආහාර ලබා දීම සිදු කරනු ලැබීය. සැමට පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා දීම මෙම වැඩසටහනේ අරමුණ විය.



# රැකවරණය පිළිබඳ ප්‍රජා ප්‍රතිචාරයක්




මෙවර වෙසක් පොහොය දිනයට සමගාමීව නිදහස් වෙළඳ කලාප කම්කරු සේවකයින්ගේ අදහසකට අනුව ඩාබිඳු සාමූහිකය විසින් සීනි සම්බෝල පාන් දන්සැලක් සංවිධානය කරන ලදී. කම්කරු සහයෝගය ඇතිව ඉකුත් මැයි මස 09 වෙනි දින කටුනායක නිදහස් වෙළඳ කලාපයේ 6යේ ගේට්ටුව අසල දී සහ ඇවරිවත්ත පොළ ඉදිරිපිට දී සාර්ථක ලෙස මෙම දන්සැල පවත්වන්නට විය. මෙමඟින් යහපැවැත්ම සහ සමාජ සම්බන්ධතාවය ප්‍රවර්ධනය කිරීමේ දී ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන සුභසාධන ක්‍රියාකාරකම්වල වැදගත්කම ද ඉස්මතු කරන ලදී. එසේම ධනාත්මක සහ සැලකිලිමත් පරිසරයක් තුළ එකට එකතු වීමට, අත්දැකීම් බෙදා ගැනීමට සහ එකිනෙකාට සහයෝගය දැක්වීමට සහභාගිවන්නන් අතර සහයෝගීතාවය, සාමූහික සත්කාර සහ සමාජ සබඳතා තවදුරටත් ශක්තිමත් කරමින්, ප්‍රජාවෙන් ක්‍රියාකාරී සහභාගීත්වයක් සහ ධනාත්මක ප්‍රතිපෝෂණයක් සමඟ වැඩසටහන සාර්තකව නිම කරන ලදී.

# වව්නියාවේ ඇඟළුම් කාන්තා සේවිකාවන් සඳහා මානසික සෞඛ්‍ය උපදේශන වැඩසටහන

වව්නියාවේ ඇඟළුම් කම්හල්වල සේවය කරන කාන්තා සේවිකාවන්ට තනි පුද්ගල මානසික සෞඛ්‍ය උපදේශන ලබා දීමේ වැඩසටහනක් මරුකරම්බලෙයි ග්‍රාම සේවක කොට්ඨාශය යටතේ ඩාබිඳු සමූහිකය විසින් 2026.04.25 වන දින කාන්තාවන් පස් දෙනෙකු සඳහා සංවිධානය කරන ලදී. ඒ අනුව කාන්තාවන් පස් දෙනෙකුට මානසික සෞඛ්‍ය උපදේශන ලබා දීමේ වැඩසටහන පවත්වන ලදී. තුෂාන්තන් ප්‍රියදර්ශනී මහත්මිය විසින් මානසික සෞඛ්‍ය උපදේශන සැසි පවත්වන ලදී. ප්‍රතිලාභීන් අතර සමීප හැඟීමක් ඇති කිරීම සඳහා ඔවුන් සමඟ කණ්ඩායම් උපදේශන සැසියක් පවත්වන ලද අතර ඉන් පසුව, එක් එක් ප්‍රතිලාභියා සඳහා තනි උපදේශන සැසි පවත්වන ලදී. ප්‍රතිලාභීන් ඔවුන්ගේ පෞද්ගලික ගැටළු බෙදා ගත් අතර ඒ සඳහා මානසික සෞඛ්‍ය උපදේශන ලබා ගන්නා ලදී.



# කම්කරු අයිතිවාසිකම් ශක්තිමත් කිරීම සහ කාන්තාවන් සඳහා ගෞරවනීය වැඩ ප්‍රවර්ධනය කිරීමේ නව ව්‍යාපෘතිය





කාන්තා ප්‍රජා සාමූහික (WCCs) බලගැන්වීම සහ කාන්තා සේවිකාවන් සඳහා බිම් මට්ටමේ නායකත්වය ශක්තිමත් කිරීම අරමුණු කරගත් බහු-වසර ව්‍යාපෘතිය "කම්කරු අයිතිවාසිකම් ශක්තිමත් කිරීම සහ කාන්තාවන් සඳහා ගෞරවනීය වැඩ ප්‍රවර්ධනය කිරීම" යටතේ ශ්‍රී ලංකාවේ, ධාබිඳු සාමූහිකය ප්‍රධාන සන්ධිස්ථාන කිහිපයක් සාර්ථකව ක්‍රියාත්මක කළේය.

ධාබිඳු සාමූහිකය මෙම ව්‍යාපෘතිය යටතේ 2026 අප්‍රේල් 7 වන දින කාන්තා ප්‍රජා සාමූහික සඳහා ව්‍යාපෘති දිශානති වැඩමුළුව පැවැත්වීය. මෙම වැදගත් සැසිය හවුල්කාර සාමූහික සමඟ ව්‍යුහගත සම්බන්ධතාවයක ආරම්භය සනිටුහන් කළ අතර, සාමූහික බලය ගොඩනැගීම, නායකත්ව හැකියාවන් ශක්තිමත් කිරීම සහ කාන්තා සේවිකාවන්ගේ අයිතිවාසිකම් ඉදිරියට ගෙන යාම කෙරෙහි අවධානය යොමු කළේය. ඒ අනුව ක්‍රියාත්මක කිරීමේ ප්‍රවේශයන් සහ අපේක්ෂිත ප්‍රතිඵල පිළිබඳ හවුල් අවබෝධයක් සඳහා දිශානතිය ශක්තිමත් පදනමක් සපයන ලදී.

මෙම වැඩසටහනේ ඉදිරි පියවරක් ලෙස ඉදිරියට යාමේදී 2026 අප්‍රේල් 28 වන දින දෙවන වැඩමුළුව මෙම ව්‍යාපෘති රාමුව යටතේ සාර්තකව පවත්වන ලදී. මෙම සැසියේ දී තෝරාගත් කාන්තා ප්‍රජා සාමූහික (WCC) එක්ව ඔවුන්ගේ ව්‍යාපෘති යෝජනා තවදුරටත් ශක්තිමත් කිරීම, ක්‍රියාත්මක කිරීමේ සැලසුම් අවසන් කිරීම සහ ඵලදායී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රධාන ලියකියවිලි ක්‍රියාවලීන් පිළිබඳ පැහැදිලි බව වැඩි දියුණු කිරීම සඳහා එක් කරන ලදී.

එසේම ගිවිසුම් අත්සන් කිරීමේ ක්‍රියා පටිපාටි, මූල්‍ය කළමනාකරණය සහ අධීක්ෂණ සහ ඇගයීම් (M&E) රාමු ඇතුළු අත්‍යවශ්‍ය ක්ෂේත්‍ර මෙම වැඩමුළුව මඟින් ආවරණය කරන ලදී. ප්‍රජා මට්ටමින් ක්‍රියාකාරකම් විනිවිදභාවයෙන් හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා සහභාගිවන්නන්ට ප්‍රායෝගික දැනුම ලබා දීම සිදු කළ අතර මූල්‍ය කළමනාකරණය පිළිබඳ මග පෙන්වීම සඳහා සම්පත්දායිකා ලෙස මූල්‍ය උපදේශක, මූල්‍ය පුහුණුකරු ශෂිකලා බොතේජු මෙනවිය සහ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සැසියට පහසුකම් සැලසීම සඳහා ධාබිඳු සාමූහිකයේ ව්‍යාපෘති කළමනාකාරිනී යසාරා විදුමිණි වීරතුංග මෙනවියත් අධීක්ෂණ සහ වාර්තාකරණය පිළිබඳ සැසිය මෙහෙයවීම සඳහා ධාබිඳු සාමූහිකයේ ඇගයීම් සහ අධීක්ෂණ නිලධාරිණී රුවිනි වාසනා මෙනවියත් සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

වැඩමුළුවේ කැපී පෙනෙන සිදුවීමක් වූයේ ගිවිසුම් අත්සන් කිරීම සහ නිල වශයෙන් භාරදීමේ උත්සවය වන අතර එය සැලසුම් කිරීමේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා තීරණාත්මක සංක්‍රාන්තියක් සනිටුහන් කළේය. ධාබිඳු සාමූහිකය පහත සඳහන් අය සමඟ නිල වශයෙන් හවුල්කාරිත්වයන් ස්ථාපිත කළේය:

මානව විමුක්තිය උදෙසා සංවර්ධනය (RED), ශ්‍රමාභිමානී කේන්ද්‍රය (SK), ශ්‍රී විමුක්ති ධීවර කාන්තා සංවිධානය, ශ්‍රී ලංකා සමානාත්මතා පදනම (SLEF), ගම්පහ දිස්ත්‍රික් පුරවැසි කමිටුව (Citizen's Committee), අපි කාන්තාවෝ සංවිධානය (WWL), ප්‍රජා දිරිය පදනම (CEF), කම්කරු අයිතිවාසිකම් ඉදිරියට ගෙන යාම සහ කාන්තාවන් සඳහා ගෞරවනීය වැඩ සහතික කිරීම සඳහා හවුල් කැපවීමක් ශක්තිමත් කරමින් අපත් සමඟ අත්වැල් බැඳ ගැනුණි. එහි දී හවුල්කාර සංවිධාන අතර විශ්වාසය, වගවීම සහ ශක්තිමත් සහයෝගීතාවය සංකේතවත් කරමින් ධාබිඳු සාමූහිකයේ විධායක අධ්‍යක්ෂිකා චමිලා තුෂාරි මහත්මිය විසින් ගිවිසුම් නිල වශයෙන් භාර දෙන ලදී.

මෙම සන්ධිස්ථානය ශ්‍රී ලංකාව පුරා කාන්තා සේවිකාවන් සඳහා ශක්තිමත් බිම් මට්ටමේ හවුල්කාරිත්වයන් ගොඩනැගීම සහ තිරසාර, අයිතිවාසිකම් පදනම් කරගත් වෙනසක් ඇති කිරීම සඳහා ධාබිඳු සාමූහිකයේ අඛණ්ඩ කැපවීම පිළිබිඹු කරයි.

# කම්කරු අයිතිවාසිකම් ශක්තිමත් කිරීම සහ කාන්තාවන් සඳහා ගෞරවනීය වැඩ ප්‍රවර්ධනය කිරීමේ නව ව්‍යාපෘතිය

## සිවිල් සංවිධාන ක්‍රියාකාරකම්

"කම්කරු අයිතිවාසිකම් ශක්තිමත් කිරීම සහ කාන්තාවන්ට යහපත් වැඩ ප්‍රවර්ධනය කිරීම" ව්‍යාපෘතිය යටතේ, කාන්තා සේවිකාවන් බලගැන්වීම, කම්කරු අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවය ශක්තිමත් කිරීම සහ සේවා ස්ථාන සහ ප්‍රජාවන් තුළ ගෞරවය, සෞඛ්‍යය සහ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් බලපෑම් සහගත ප්‍රජා පාදක වැඩසටහන් කිහිපයක් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. මෙම මුලපිරීම් ක්‍රියාත්මක කරන ලද්දේ ප්‍රජා සංවිධාන, සම්පත්දායකයින් සහ සමාජ සාධාරණත්වය සහ කාන්තා සවිබල ගැන්වීම සඳහා කැපවී සිටින බිම් මට්ටමේ ජාලවල සහාය සහ සහයෝගීතාවයෙනි.

මෙම ව්‍යාපෘතිය යටතේ සංවිධානය කරන ලද ප්‍රධාන මුලපිරීම්වලින් එකක් වූයේ ධාබිඳු සාමූහිකයේ අනුග්‍රහයෙන් පවත්වන ලද මනෝවිද්‍යාත්මක උපදේශන සහ මානසික යහපැවැත්ම වැඩසටහනක් වන අතර එය ගම්පහ දිස්ත්‍රික් මානව හිමිකම් පුරවැසි කමිටුව විසින් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන සහභාගිවන්නන් අතර මානසික සෞඛ්‍ය පිළිබඳ දැනුවත්භාවය, චිත්තවේගීය යහපැවැත්ම සහ ආතති කළමනාකරණය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. සමාජීය සහ සේවා ස්ථාන පීඩනයන්ට මුහුණ දෙන සහභාගිවන්නන් සඳහා ප්‍රායෝගික මග පෙන්වීම සහ වෘත්තීය උපදේශන සහාය බෙදා ගත් ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත උපදේශක වත්සලා ජයකොඩි මහත්මිය විසින් වටිනා සම්පත් දායකත්වයක් ලබා දෙන ලදී.

කම්කරු අයිතිවාසිකම් පිළිබඳ දැනුම ශක්තිමත් කිරීමට අනුකූලව, "අපගේ අයිතිවාසිකම් දිනා ගැනීමට, දැනුමෙන් අපි බලගන්වමු" යන තේමාව යටතේ කටුනායක නිදහස් වෙළඳ කලාපයේ සාමාජිකයින් සඳහා **ILO C190** වැඩ ලෝකයේ ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර පිළිබඳ සම්මුතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් **Red** ආයතනය විසින් පවත්වන ලදී. මෙම වැඩසටහනේ අරමුණ වූයේ සේවා ස්ථානවල හිංසනය, හිරිහැර, ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ වෙනස්කම් කිරීම සහ කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා සාමූහික ක්‍රියාමාර්ගයේ වැදගත්කම පිළිබඳව සේවකයින් දැනුවත් කිරීමයි. සැසිය සඳහා සම්පත් දායකත්වය **Voice of Migrant Network** හි කල්ප මධුරංග මහතා විසින් සපයන ලද අතර, ඔහුගේ විශේෂඥතාව ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් යටතේ සහභාගිවන්නන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් සහ ආරක්ෂාව වඩා හොඳින් අවබෝධ කර ගැනීමට උපකාරී විය.

මෙම ව්‍යාපෘතිය යටතේ පවත්වන ලද තවත් වැදගත් වැඩසටහනක් වූයේ පුත්තලමෙහි උත්තර් අට්ටවිල්ලුව ප්‍රජා ශාලාවේ පැවති විශේෂ වෛද්‍ය උපදේශන සහ සෞඛ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහනකි. වැවිලි, ධීවර, කෘෂිකාර්මික සහ අවිධිමත් අංශයේ රැකියා වල නියැලී සිටින කාන්තාවන් සැසියට සහභාගී විය. කාන්තා සෞඛ්‍යය, රෝග වැළැක්වීම, වෘත්තීය සෞඛ්‍ය දැනුවත්භාවය සහ සෞඛ්‍ය සේවා තොරතුරු සඳහා ප්‍රවේශය කෙරෙහි වැඩසටහන අවධානය යොමු කළේය. පුත්තලම ලිංගාශ්‍රිත රෝග නිවාරණ ඒකකයේ සම්පත්දායකයින්, භාර වෛද්‍ය නිලධාරී සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක ඇතුළු, සහභාගී වූවන්ට වටිනා වෛද්‍ය මග පෙන්වීමක් සහ දැනුවත් කිරීමක් ලබා දුන්හ. මෙම වැඩසටහන ප්‍රජා



දිරිගැන්වීමේ පදනම විසින් ක්‍රියාත්මක කරන ලද අතර, එයට ධාබිඳු සාමූහිකයේ අධීක්ෂණය සහ ආසියානු පදනමේ මූල්‍ය සහයෝගය ලැබුණි.

කම්කරු අයිතිවාසිකම් සහ සෞඛ්‍ය ආශ්‍රිත වැඩසටහන් වලට අමතරව, තරුණයින්, පාසල් හැරගිය අය, විශ්ව විද්‍යාල සිසුන්, රැකියා සොයන්නන් සහ දෙමාපියන් සඳහා වෘත්තීය සහ අධ්‍යාපනික මාර්ගෝපදේශ වැඩසටහනක් ද සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා සමානාත්මතා පදනම විසින් ක්‍රියාත්මක කරන ලද නැගී සිටින්න සාමූහික ව්‍යාපෘතිය යටතේ පවත්වන ලද මෙම වැඩසටහන මගින් උසස් අධ්‍යාපන අවස්ථා, වෘත්තීය මාර්ග, ජීව දත්ත පත්‍රිකාව සකස් කිරීම, සම්මුඛ පරීක්ෂණ කුසලතා සහ වත්මන් රැකියා වෙළඳපොළ ඉල්ලීම් පිළිබඳ මග පෙන්වීමක් ලබා දෙන ලදී. සාර්තක අනාගතයක් ගොඩනැගීම සඳහා අවශ්‍ය දැනුම සහ විශ්වාසය තරුණ තරුණියන් සවිබල ගැන්වීම මෙම මුලපිරීමේ අරමුණ විය.

මෙම වැඩසටහන් මගින් කාන්තා සවිබල ගැන්වීම, ශ්‍රම ගරුත්වය, මානසික යහපැවැත්ම, අධ්‍යාපනය සහ සමාන අවස්ථා ප්‍රවර්ධනය කිරීමේදී බිම් මට්ටමේ ක්‍රියාකාරිත්වයේ වැදගත්කම සාමූහිකව පෙන්නුම් කෙරේ. දැනුවත්භාවය, උපදේශනය, සෞඛ්‍ය අධ්‍යාපනය සහ කුසලතා සංවර්ධනය තුළින්, මෙම ව්‍යාපෘතිය කාන්තා සේවිකාවන් සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් සඳහා ආරක්ෂිත සහ වඩාත් සහාය දක්වන පරිසරයන් නිර්මාණය කිරීම දිගටම කරගෙන යයි.

"කම්කරු අයිතිවාසිකම් ශක්තිමත් කිරීම සහ කාන්තාවන් සඳහා යහපත් වැඩ ප්‍රවර්ධනය කිරීම" යන ව්‍යාපෘතිය යටතේ අපගේ ප්‍රදානලාභී හවුල්කරු වන ප්‍රජා දිරිය පදනම විසින් සිදු කරන ලද මුලපිරීමක් බෙදා ගැනීමට ලැබීම ගැන ආඩම්බර වෙමු. කාන්තාවන්ගේ කම්කරු අයිතිවාසිකම්, සෞඛ්‍ය සහ යහපත් රැකියා අවස්ථා ශක්තිමත් කිරීම සඳහා ඔවුන්ගේ අඛණ්ඩ කැපවීම අපි අගය කරමු.

# ගෞරවනීය Per Anger සම්මානයෙන් පිදුම් ලැබූ බ්‍රිටෝ ප්‍රනාන්දු සහෝදරයා සාදරයෙන් පිළිගනිමු



ශ්‍රී ලංකාවේ අතුරුදන් වූ පුද්ගලයන්ගේ පවුල් වෙනුවෙන් දශක ගණනාවකට අධික කාලයක් තිස්සේ සත්‍යය, යුක්තිය සහ වගවීම වෙනුවෙන් අඛණ්ඩව හඬ නඟමින් කටයුතු කළ බ්‍රිටෝ ප්‍රනාන්දු සහෝදරයාට ස්වීඩන රජයේ ජාත්‍යන්තර මානව හිමිකම් හා ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන Per Anger සම්මානය ඉකුත් මැයි 21 වන දින හිමිවිය. මෙම සම්මානය ඔහුගේ දශක 35කට අධික කැපවීම හා අතුරුදන් වූවන්ගේ පවුල් වෙනුවෙන් සිදු කළ අරගලය ඇගයීමක් ලෙස ප්‍රදානය කරන ලදී.

මෙම සුවිශේෂී ජයග්‍රහණය සමරමින් බ්‍රිටෝ සහෝදරයා පිළිගැනීම සඳහා ඩාබිදු සාමූහිකය, අතුරුදහන් වූවන්ගේ පවුල්වල එකමුතුව, මානව විමුක්තිය උදෙසා සංවර්ධනය සංවිධානය සහ මානව හිමිකම් ක්‍රියාකාරීන්, අතුරුදන් වූවන්ගේ පවුල් නියෝජිතයින් සහ සහෝදර සහෝදරියන් රැසක් එක් වූහ.

උත්සවයට එක් වූ සියලු දෙනා බ්‍රිටෝ සහෝදරයාගේ කැපවීම සහ ධෛර්යය අගය කරමින්, මෙම ජාත්‍යන්තර ඇගයීම ශ්‍රී ලංකාවේ සත්‍යය, යුක්තිය සහ මානව හිමිකම් වෙනුවෙන් කටයුතු කරන සියලු දෙනාටම ලැබුණු ගෞරවයක් බව අවධාරණය කළහ.

බ්‍රිටෝ සහෝදරයා විසින්ද මෙම සම්මානය තමාට පමණක් නොව, වසර ගණනාවක් පුරා සත්‍යය සහ යුක්තිය වෙනුවෙන් අරගල කළ අතුරුදන් වූවන්ගේ පවුල් සියල්ලන්ටම අයත් ගෞරවයක් බව සඳහන් කර ඇත.

අපි බ්‍රිටෝ සහෝදරයාට උණුසුම් සුබපැතුම් එක් කරමින්, ඔහුගේ ඉදිරි කටයුතු සඳහාද ශක්තිය, ධෛර්යය සහ සාර්ථකත්වය ප්‍රාර්ථනා කරමු.

# වව්නියාවේ ඇඟළුම් කාන්තාවන් අතර ආරක්ෂිත කවයක් ස්ථාපිත කිරීම සඳහා සූදානම් කිරීමේ වැඩසටහන

ඇඟළුම් කම්හල්වල සේවය කරන කාන්තාවන් රටේ කොඳු නාරටිය වන අතර ඔවුන් ශක්තිමත් කළ යුතුය. වව්නියාවේ ක්‍රියාත්මක වන ඇඟළුම් කම්හල්වල සේවය කරන තෝරාගත් කාන්තාවන් 25 දෙනෙකුට නායකත්ව පුහුණුව ලබා දීම සහ ඔවුන් ශක්තිමත් කිරීම සහ ආරක්ෂිත කවයක් පිහිටුවීම සඳහා සූදානම් කිරීමේ වැඩසටහනක් 2026.05.03 වන දින වව්නියාවේ දී පැවැත්විණි. මේ සඳහා කාන්තාවන් 50 දෙනෙකු සහභාගී වූ අතර ඔවුන්ගෙන් 25 දෙනෙකු තෝරා ගැනීම සඳහා සම්පත්දායකයින් ලෙස ශ්‍රී දේවි මහත්මිය සහ අධිනීතිඥ චාරුකේෂි මහත්මිය සහභාගී වූහ. කණ්ඩායම් ක්‍රියාකාරකම් සහ ප්‍රශ්නාවලියක් භාවිතා කිරීම හරහා තෝරා ගැනීම සිදු කරන ලදී.

# සිතුවිල්ල

ළිඳ ළඟ සංගමය සෙට් වෙලා බෝඩිම දෙදරන්න සද්දේ. හිනාව... බැනුම් අස්සේ මාත් රිංගුවා ඕපේ සොයන්න. කාන්තා දිනය වෙනුවෙන් ආයතනවලින් ලබා දී තිබූ තෑගි ගැන සාකච්ඡාව. දීපු නොදීපු ආයතන ගැන කියවන ගමන් සමහරු හිටියේ මූණවල් ඇඹුල් කරන්. මොකද ඔච්චර මැරිලා හම්බ කරලා දීලත් සමහර ආයතන දීලා තිබුණේ "මග්" එකක්. තවත් සමහරු දෙළුම් පැළ රෙද්දක් වනාගන්න ඉඩක් නැති බෝඩිමේ පැළ. ඉන්දන්න කොහේ තියන ඉඩක්ද? සන්ධ්‍යා මිරිස් පැළ වගයක් හිටවලා තිබුණා. ඒවා වැඩට ගිහින් එද්දී කඩාගෙන ගිහින්. ඉතිං දෙළුම් කොහේ හිටවන්නද? වැලේ රෙද්දත් නැති වෙනකොට. ඒක ගැන කට්ටිය සිය විරෝධය පළ කළාට. එතන පත්තර කන්තෝරුව වගේ. ෆෝන් හොරකම් කරපුව. මග තොටේ දී වෙන හිංසන, ෂිපර් මැන්ලාගේ කරදර, බෝඩිම මදිවට පාරේ ඉස්සරහටත් ඇවිත් පෙන්නගෙන ඉන්නවලු. ඒ විතරක්නම් බැරියැ වැඩපළේ සුපවයිසර්ටත් ලස්සන කෙල්ලො පෙන්නන්න බැරිලු. එයාගේ ඔෆිස් එකට ගෙන්න ගන්නවලු. මානව අංශය සිද්දිය ගැන දැන දැනත් කිසිම පියවරක් ගන්නේ නැතිලු.

ඒක කියපු ගමන් රජිණි කීවේ එයාලගේ ආයතනයේනම් ඒ වගේ කරලා මාස තුනක් යනකං වැඩ නැවැත්තුවා කියලා. සිරා සිද්ධි මේවා. ගිරව් ටික වගේ කියවිල්ල. අනුන්ගේ ඕපෙ හොයන්න ගිහින් සමහරුන්ගේ ඇගේ ගාපු සබනුත් වේලිලා. අපි ඉතිං මේ ප්‍රශ්න කොහේ ඉදිරිපත් කරන්නද. මේක තමයි අපේ වේදිකාව, අපේ දුක, වේදනාව පිටකරගන්න කියව ගත්තට ළිඳ ළඟ කියවන ඒවට සාධාරණයක් ඉෂ්ඨ වෙන්නේ නෑනේ. අපිව නිහඬ කරලා, අපිව අනාරක්ෂිත කරලා, අපේ අයිතීන් කප්පාදු කරලා අපි ගැන කිසිඳු වගකීමක් නොගන්නා නිළධාරීන් ගැන අපිට තියෙන්නේ සාධාරණ කේන්තියක්. අපි කොහොමද හෙට දවසේ යුක්තිය ඉටු කරන්නේ. අපේ අනාගතය සුරක්ෂිත කරගන්නේ. කර්මාන්තය රැක දෙන්නේ. මමත් දීලා ඇද්දා කතාවක් වෘත්තීය සමිති නායිකාවක් වගේ, මෙවර මැයි දිනයේ එකතු කරගත්තු කාරණාත් එක්ක. කට්ටිය අත්පුඩියක්. ගහලා මට සප් එකක් දුන්නා. නෙළුම් කියනවා. ඔයා අපේ ෆැක්ට්‍රියට ආවනම් අපිට වෘත්තීය සමිතියක් හදන්න තිබුනා කියලා. මටම හිතුනයි මැයි දිනය දවසෙත් වැඩට එන්න කියලා බල කරාම මොන වෘත්තීය සමිතිද කියලා. කතාව අතරේ මතක් වුනේ මාලනීව බලන්න මීගමුව ඉස්පිරිතාලෙට යන්න ඕන නේද කියලා. හැමෝටම සමු දීලා හනික ගියා කාමරේට.

සමන්තා

# ප්‍රහේළිකා අංක - 56

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | | ■ | 4 |
| 5 | | | ■ | 6 | |
| 7 | | | | ■ | |
| 8 | | ■ | ■ | 9 | ■ |
| ■ | | ■ | 10 | | 11 |
| 12 | | | | ■ | |

## හරහට

1. බිතු සිතුවම් නිසා මෙය ලෝ පතලය.
5. සංගීත නැටුම් කලාවේදී මෙය ඉතා අවශ්‍යය
6. ලග්නයකි.
7. මයුර තුරඟ යනුවෙන් මේවා 16කි.
8. බාහුව හා ගෙල අතර පෙදෙස
10. පිපාසයට සමාන වචනයක්.
12. මෙය නිසා වගා ආදිය පාලු වී යයි.

## පහළට

1. පුරාණ ලංකාවේ රාජධානියක්
2. හදිසි රෝගී අවස්ථාවලදී ඉතා ප්‍රයෝජනවත් වාහනයක්
3. පුරාණ මිනුම් දණ්ඩක්.
4. උස් සමතලා බිම්.
9. අම්මා
10. ඇවිදීමට උපකාරී වේ.
11. රෝදය

**මෙම ප්‍රහේළිකාව නිවැරදිව පුරවා පහත සදහන් ලිපිනියට ඒවා මුදලින් වටිනා තෑගි දිනාගන්න.**

**ඩාබිඳු සාමුහිකය**
**221, වෙළබඩ පාර, කටුනායක.**
**දුරකථන අංකය: 077 725 9892**

# බංග්ලාදේශ ඇඟළුම් සේවකයින් කාලෝචිත ඊද් ගෙවීම් ඉල්ලා සිටී

රටේ රෙදිපිළි අංශය පුරා කර්මාන්ත ශාලා කිහිපයක ප්‍රමාද වූ වැටුප් සහ නොගෙවූ උත්සව ප්‍රසාද දීමනා හේතුවෙන් 2026 මාර්තු මාසයේ ඊද්-උල්-ෆිතර් දිනයට පෙර බංග්ලාදේශයේ ඇඟළුම් සේවකයින් අවිනිශ්චිතතාවයකට මුහුණ දුන්හ.

ඩකාහි පැවති රැස්වීමකදී, කම්කරු හා රැකියා අමාත්‍ය අරිෆුල් හක් චෞද්රි කර්මාන්තශාලා හිමියන්ට උපදෙස් දුන්නේ වැඩ කරන දින හතක් ඇතුළත සියලුම හිඟ වැටුප් ඉවත් කර නිවාඩු සමයට පෙර ඊද් ප්‍රසාද දීමනා ගෙවන ලෙසයි. ප්‍රමාදයන් කම්කරුවන්ට මූල්‍ය දුෂ්කරතා ඇති කළ හැකි අතර කම්කරු නොසන්සුන්තාව වැඩි කළ හැකි බව රජය අනතුරු ඇඟවීය.

බොහෝ ඇඟළුම් සේවකයින්, විශේෂයෙන් කාන්තා සේවිකාවන්, ඉහළ යන ජීවන වියදම් සහ ආර්ථික අනාරක්ෂිතභාවය සමඟ දිගටම අරගල කරන බව කම්කරු නියෝජිතයින් අවධාරණය කළහ. සූදානම් කළ ඇඟලුම් (RMG) කර්මාන්තය තුළ ශක්තිමත් ශ්‍රම ආරක්ෂණ සහ සේවක අයිතිවාසිකම් වඩා හොඳින් ක්‍රියාත්මක කිරීම සඳහා ද ඔවුන් ඉල්ලා සිටියහ.

ඊද් කාලය තුළ කාර්මික ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා සේවා යෝජකයින් සහ සේවකයින් අතර සහයෝගීතාවයේ වැදගත්කම රජය අවධාරණය කළේය.

**https://tds-images.thedailystar.net/business/news/factory-owners-urged-clear-arrears-week-4119761?utm_**



# ලේන්සුවක සැඟවුණු කඳුල

හෙට ලොවක් එළ දරණ සිත් වලින් නැගුණු...
ජීවිතය විනිවිදින සිනහ මල් කුළුණු...
මව් වෙසින් දූ වෙසින් සිය මතට නැගුණු...
දිරිය ලිය දවයි ගිනි බුර බුරා නැගුණු...
ඝොර සතුන් වන සතුන් ඈ දවාලන විලස...
ඈ දකින සුබ සිහින මිලින කොට හප කරන...
ඩොලර් වෙත සිය සිහින දෙවැනි කොට පණ පොවන...
සුරු ලිය සුරකිමු සිරිලකෙහි මතු නිබඳ...
කප්පරක් වැඩ කන්ද සිනහවෙන් සඟවගෙන...
කෝටියක් පවුල් බර එඩි සිතින් දරාගෙන...
සුවහසක් පුතුන් දැරූ  ප්‍රජාපති මව් විලස...
ඈ දෑත සව්මත්‍ය ලොව දරා ඉනු පිණිස...
ජීවිතය පියුම් විල බබළන්න තැනුණු...
ලෝකයක් අත දරා නිහඬවම පිපුණු...
නිල බලය තේජසින් සපිරි ඔද වැඩුණු...
වැඩ ඇරී වැඩට යති අඳ හෙටත් ගැහැණු...

ඒ. චාන්දනී - බියගම වෙළඳ කලාපය

# 2026 ජාත්‍යන්තර කම්කරු දිනය - කටුනායක




අංක: 221, වෙළඹඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදි.